# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2282/60 - 2022 ජුනි මස 03 වැනි සිකුරාදා - 2022.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 5 වන, 7 වන සහ 8 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/38 දරන රජයේ *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* පළ කරන ලද 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරතවීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග (නියෝග), මෙමගින් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

නියෝගවල උපලේඛනයෙහි අංක 2 දරන ඡේදය යටතේ වන අංක (3) දරන අනුඡේදය සඳහා පහත පරිදි කරුණු ඇතුළත් කරනු ලැබේ.

(3) "2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධානවලට අනුව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරතවීමට අවසරය ඇති බලයලත් පුද්ගලයෙකුගෙන් විදේශ විනිමය උපයන මතු දැක්වෙන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් :-

(අ) බලයලත් පුද්ගලයෙකුගේ සේවා නියුක්තිකයෙකු;

(ආ) භාණ්ඩ හා සේවා සැපයීමේ අරමුණින් බලයලත් පුද්ගලයෙකු සමග ව්‍යාපාර කටයුතුවල නිරතවී සිටින ඕනෑම පුද්ගලයෙකු".

EOG 06 - 0056


1A - PG 5861 - 456 (2022/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*